# නර්තනය - 6 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

## ඒකකය: ලී කෙළි හා කළගෙඩි කවි ගායනා




- ලී කෙළි නැටුම හා බැඳි ගායනා විශේෂයකි.
- ගැමි ජනයා විනෝදාස්වාදය සඳහා ලී කෙළි කවි ගායනා කරමින් නර්තනයේ යෙදෙයි.
- සරල බස් වහරක්, නාද මාලාවක් හා සරල තාල රූපයක් ඇත.
- ගැමි ජීවන රටාවේ පැවති ඇදහිලි, විශ්වාස, සාරධර්ම, එකමුතුකම හා සාමූහිකත්වය ලී කෙළි කවි මඟින් පෙන්නුම් කරයි.

<u>ලී කෙළි කවි</u>

1ග එක පඳුරෙන් ලී සයක්
කපාගෙන එක උස ඇති සදෙනෙක්
තෝරා ගෙන
ගුරුන් අතට දී ලී
බෙදවාගෙන අපිත් කෙළිමු ලී දෙපිළ
සැදීගෙන

2ග අහසේදෙවියෝ රැස්ව
සිටින්නයි පොළවේ දෙවියෝ බිම වැඳ
ගන්නයි සතර වරම් දෙවි බලා
සිටින්නයි අද ලී කෙළියෙන් අප
දිනවන්නයි

3ග ඉරට ඔබිය ඉර මුදුනේ
සිටියා සඳට ඔබිය සඳවට තරු
හිටියා
ලියට ඔබිය සුදු සේලය
නෙරියා අපට ඔබිය සබ මැද ලී
කෙළයා

4ග උදයට පායන හිරු දෙවියන්ටයි
සවසට පායන සඳ දෙවියන්ටයි
මාගේ ගුරුවර
දෙමාපියන්ටයි වැඳ වැඳ පින් දෙමි
නිවන් දකින්ටයි

ක්‍රියාකාරකම

1ග ලී කෙළි ගායනාවල සුවිශේෂී ලක්ෂණ 03ක් ලියන්න.
2ග ලී කෙළි කවියක් ගායනා කරන්න.
3ග මෙම කවි ගායනා සංරක්ෂණයට ඔබ කරන යෝජනාවක් ලියන්න.


- උපදේශකත්වය – එස්. එම්. ඩී. ජී .සේනානායක (ස. අ .අ. නර්තන ක. අ. කා. හෝමාගම)
- ටී. එච්. ප්‍රියන්තා දමයන්ති මිය (බප/ හෝ/ බෝජේ රාජසිංහ මහා විද්‍යාලය)
- එම්. අයෝමා විමලවීර මිය (බප/ හෝ/ පාදුක්ක සිරි පියරතන ම.ම.වි.)
- ඩී.එස්. තරංගා දැරණියගල මිය (බප/ හෝ/ සුභාරතී මහාමාත්‍ය මහා විද්‍යාලය